# Living the Lotus 1

2024

Buddhism in Everyday Life

VOL. 220




*Rissho Kosei-kai of San Antonio*


**Living the Lotus**
**Vol.220 (January 2024)**

Senior Editor: Keiichi Akagawa
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana,
Sahan Chamara , Rajitha Madurangha
published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සැම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.



# හදවත සහ මනස සංවර්ධනය තුළින් ලබන ආධ්‍යාත්මික දියුණුව

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## 「වීර්යය බර උසුලන ගවයෙකු වැනිය」

ඔබ සැමට සුභ නව වසරක් වේවා!

‘සියලුම දොරටු කුඩා ෆයින් ගස්වලින් සරසා ඇති සෑම නිවසකටම වසන්තය පැමිණේ’ යන කවිය නිවෙස්වලට උදවන වසන්ත කාලයේ දීප්තිමත් මනෝභාවය නිරූපණය කරමින්, සයිගියෝ පූජකතුමා විසින් නව වසර සැමරීමට නිර්මාණය කළ කවියකි. වර්තමානයේ නව වසර පිළිගැනීමට ෆයින් ගස් වල සැරසිළි වලින් ඇතුළුවීමේ දොරටුව ඉදිරිපස අලංකාර කරන නිවාස අඩුයි. නමුත්, ජපානයේ මෙම ප්‍රබෝධමත් අලුත් අවුරුදු දර්ශනය මෙන් ප්‍රබෝධමත් හැඟීමකින් සැමට දීප්තිමත් සහ නීරෝගී නව වසරක් ප්‍රාර්ථනා කරමි.

අපි ධර්මය ඉගෙනගෙන, එයට අනුව මිනිසුන් ලෙස එක් පියවරක් හෝ දෙකක් වුවද දියුණු වීමට ප්‍රාර්ථනා යුතුය. එය කිසි දිනක ඉටු නොවන ප්‍රාර්ථනාවක් නොව, බුදුන් මෙන් ජීවත් වීමට තීරණය කර ධර්මය වීර්යයෙන් යුතුව අනුගමනය කළහොත්, සැමවිටම මිනිසෙකු ලෙස සාර්ථකත්වයේ සහ දියුණුවේ ප්‍රීතිය ලබාගත හැකි බව අප ඉගෙනගෙන ඇත.

කෙසේ වෙතත්, ධර්ම පුහුණුව සහ ආධ්‍යාත්මික දියුණුව පිළිබඳව අසන විට, විශිෂ්ඨ ලෙස උත්සාහ නොකරන්නේ නම්, ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් විය නොහැකි යයි සිතන බොහෝ දෙනෙක් සිටිති. කෙසේ වෙතත්, මුල් සූත්‍ර ග්‍රන්ථයේ සුත්තනිපාතයේ, ශාබ්‍යමුණි බුදුන් වහන්සේ ‘වීර්යය බර උසුලන ගවයෙකු වැනිය. එය අපව සාමකාමී බවකට පත්කරනු ඇත’ යනුවෙන් දේශනා කළහ. මෙම ප්‍රකාශය තුළ රළු බවක් හෝ ගාම්භීරත්වය පිළිබඳව අංශු මාත්‍රයක හෝ හැඟීමක් නොමැති අතර, ගවයන් සෙමින් සහ නිශ්ශබ්දව කරත්තයක් අදින ආකාරය සහ ගවයන් නිහඬව නගුලක් අදිමින් කුඹුරක් සීසාන අයුරු මැවී පෙනේ. එවැනි දේවල් මතකයේ තබාගෙන, අපි නැවතත් ඉක්මන් නොවී විවේකත් නොගෙන, බෞද්ධ දේශනා තුළින් අපගේ හදවත සහ මනස සංවර්ධනය කරගනිමින්, ජීවිතය සෙමෙන් පිය නැඟීම වැදගත් යන සිතුවිල්ල මත මීට වසර 25 කට පමණ පෙර මම ‘හදවත සහ මනස සංවර්ධනය’ යන ග්‍රන්ථය පළ කලෙමි.

එම ග්‍රන්ථය තුළින් ‘හදවත සහ මනස සංවර්ධනය’ පාඨය හඳුන්වා දුන්නෙමි. එයට හේතුව ශාබ්‍යමුණි බුදුරදුන්ගේ සැබෑ දේශනාවලට සමීප බව කියවෙන සුත්ත නිපාතයේ පූජනීය ග්‍රන්ථවල

ගාථාවන් ඔස්සේ නිකාය සහ සූත්‍ර ග්‍රන්ථවල වෙනස්කම් ඉක්මවා යන දේවල් සහ බුදුදහමේ ඉගැන්වෙන මිනිස් ජීවිතයේ මූලික කරුණු පිළිබඳව සියලුම දෙනා සමඟ සිතීමට අවශ්‍ය වීමයි. ඒ අනුව ශාක්‍යමුණි බුදුන්වහන්සේ දේශනා කළ දේ සරලව පිළිගෙන, එදිනෙදා ජීවිතයේ දී ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම, ශාන්තිය උදාකර ගත හැකි මාර්ගයක් බව මම විශ්වාස කරමි.

එසේනම්, ශාක්‍යමුණි බුදුන්වහන්සේට අපට අවබෝධ කරදීමට අවශ්‍ය වූයේ කුමක්ද?

## බාධාවකින් තොරව

නිර්මාතෘතුමා විසින් 'මිනිසුන් එක සමානයි, සියල්ල එකිනෙකට බද්ධ වී ඇත. මෙය බුදු දහමේ මූලික චින්තනය මිස අන් කිසිවක් නොවේ' යනුවෙන් පැහැදිලිව ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව දැස් විවර කර බැලුවහොත්, අපගේ දෘෂ්ටිකෝණය වෙනස් වී ජීවන රටාව වෙනස් වනු ඇති අතර, මෙලෙස සිතන මිනිසුන් බොහෝමයක් සිටින ලෝකයක අප ජීවත් වන්නේ නම් සැමට සමගියෙන් ජීවත් විය හැකිය. බුදු දහමේ උගන්වන්නේ එයයි. විවිධ ආගමික කණ්ඩායම් සහ නිකායන් සිටියද, සියල්ලන්ම 'සෑම ජීවිතයක්ම එක හා සමානව වටිනා සහ කෘතඥපූර්වකය', 'සියල්ලන්ම එකම ජීවිතයකට සම්බන්ධව සිටින මිතුරන්ය' යන ශාක්‍යමුණි බුදුන් වහන්සේගේ දේශනාවන්ට අනුව එක්සත්ව, මිනිසුන් තම ස්වභාවය සහ  අවශ්‍යතාවයන්ට අනුව විවිධාකාරයෙන් ප්‍රකාශ කරන බවට මම විශ්වාස කරමි.

සෝතෝ නිකායේ එයිහෙයි විහාරයේ විහාරධිපති ලෙස කටයුතු කරන රෙයිරින් යමද ස්වාමීන් වහන්සේ විසින්, 'සෙන් නිකායේ දෝගෙන් සෙන් ස්වාමීන් වහන්සේ කුමක් දුටුවත් ඇසුවත් එය 'තමන්' ලෙස හැඟේ' යනුවෙන් ප්‍රකාශ කළේය. අපි 'අනෙක් අය' ලෙස හඳුන්වන දෙය සෙන් ගුරුවරුන් විසින් 'අනෙක් අය දකින තම ආත්මය' ලෙස හඳුන්වනු ලබයි. අනෙක් දේවල් සියල්ල අනෙක් දේවල් වන නමුත් එය 'තමන්' ලෙස දැනී, එම ප්‍රීතිය සහ දුක ස්වයං ප්‍රීතිය සහ ස්වයං දුක වේ'. එනම් එය 'මිනිසුන්ගේ සැබෑ ජීවිතය' යන්නයි.

බුදුදහමේ ඇති දැඩි පුහුණුව ආධ්‍යාත්මික දියුණුවක් වන නමුත්, මම එදිනෙදා ජීවිතයේදී ආත්මාර්ථකාමී තණ්හාව, ක්‍රෝධය සහ ඊර්ෂ්‍යාවෙන් අපගේ අවධානය වෙනතකට යොමු කරන සෑම මොහොතකම 'සියලුම මනුෂ්‍යයන් එක හා සමානයි එකිනෙකට බද්ධ වී ඇත' යන මානසිකත්වයට නැවත පැමිණීම ආධ්‍යාත්මික දියුණුව බවත්, මෙම විශ්වාසය අඛණ්ඩව පවත්වාගෙන යාම මිනිසුන් වන අපගේ ජීවන රටාව සහ ශාක්‍යමුණි බුදුන්ගේ ප්‍රාර්ථනාව මුල් කරගත් ජීවන රටාවක් බවත් විශ්වාස කරමි. මෙම හැඟීම එදිනෙදා යහපත් වචන සහ ක්‍රියාවන්ට සහය වන පරිදි හදවත සහ මනස සංවර්ධනය කරමින්, සෑම දිනකම නිරෝගීව සහ සාමයෙන් පියනැගීමට ඉවහල් වේ.

2024 ජනවාරි මස 'කෝසෙයි' සඟරාව ඇසුරෙණි



# Interview



## බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය ව්‍යාප්ත කර නිව්යෝර්ක් නගරයේ වෙනසක් ඇති කරනවා

ලින්ච් ජේම්ස්, ශාඛා ප්‍රධානී
රිෂ්ෂෝ කෝසෙයි කායි, නිව්යෝර්ක් ධර්ම ශාඛාව

**නිව්යෝර්ක් ධර්ම ශාඛාවේ කියෝකයිචෝ ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලැබීම ගැන ඔබේ හදවතේ හැඟීම මොන වගේද?**

ඇත්තෙන්ම, ධර්ම ශඛාවේ නායකයින් ඇතුළු කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ විශිෂ්ඨ වූ චරිතයන් තුලින්, නිර්මාතෘ තුමා පෙන්වා දුන් අන් අය වෙනුවෙන් ජීවත්වන බෝධිසත්ව වරයෙකුගේ හැඟීම හොඳින්ම වැටහෙනවා, නිර්මාතෘ තුමාගේත්, නිච්කෝ නිවානෝ තුමාගේත් සහ කෝෂෝ මැතිනියගේත් ප්‍රාර්ථනයන් සුළුවෙන් හෝ ඉෂ්ඨ කිරීමට හැකිවන පරිදි, මම මෙතැන් සිට අන් අයට ප්‍රයෝජනවත් පුද්ගලයෙකු විය යුතුයි යන්න ගැන පමණක් කල්පනා කරමින් සිටිනවා.

**නිව්යෝර්ක් ධර්ම ශාඛාවේ කියෝකයිචෝ ලෙස අමෙරිකා ජාතිකයෙකු පත්වන පළමු අවස්ථාව මෙය වන අතර, ඒ ගැන ඔබගේ හැඟීම කුමක්ද?**

ධර්ම ශඛාවේ මේවන තෙක් කියෝකයිචෝවරු හදවතින්ම ඇමෙරිකාවට ආදරය කරමින්, සිය දයාවේ ශක්තියෙන් නිව්යෝර්ක් හි ධර්මය ප්‍රචාරය කරමින්, ඔවුන් නිව්යෝර්ක් වැසියන් බවට පත්වන්නට ඇතැයි මම හිතනවා. නිව්යෝර්ක් ධර්ම ශාඛාවේ පළමු අමෙරිකානු ජාතික කියෝකයිචෝ ලෙස මම පත් වුවත්, එය මෙතෙක් සිටි කියෝකයිචෝවරුන් විවිධාකාරයෙන් බුදුන් වහන්සේගේ ධර්මය උගන්වමින් මගපෙන්වූ නිසයි ඒ සඳහා මම හදවතින්ම කෘතවේදී වනවා. ඒ වගේම විවර කර පෙන්වා දුන් මාර්ගයේ විවේක නොගෙන පියවරෙන් පියවර ඉදිරියට ගමන් කරන්න බලාපොරොත්තු වනවා.

**කෝසෙයි කායි සාමාජිකයෙකු ලෙස ධර්මය විශ්වාස කරන්න හේතු වූ කාරණය සහ ඒ කුමන කාල වකවානුවකදීද?**

මගේ අම්මා 1992 අවුරුද්දේ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වූ අතර, මම දෙවන පරම්පරාවේ සාමාජිකයෙකු වනවා. මගේ අම්මා දැඩි ලෙස ධර්මය විශ්වාස කල අතර, නිව්යෝර්ක් නගරයේ ප්‍රචණ්ඩ ක්‍රියාවන් අපරාධයන් සහ සමාජ ගැටලු ඇතිවන අවස්ථාවන් වලදී බෞද්ධයන් ලෙස ඒ වෙනුවෙන් අපට කල හැක්කේ කුමක්ද යනුවෙන් කල්පනා කරමින් කටයුතු කලා. 2017 අවුරුද්දේ අම්මාට පෙනහළු පිළිකාවක් ඇති බව හඳුනාගත් අතර, 'මට ඔයාගේ උදව් අවශයයි කරුණාකර ධර්ම ශාඛාවට ගොස් මගේ සුවය ප්‍රාර්ථනා කරන්න' යැයි අම්මා පැවසුවා. එම සිදුවීම මා තුල ධර්මය කෙරෙහි විශ්වාසය දැඩි කලා. දැන් ඒ ගැන කල්පනා කර බලන විට, එම සිදුවීම මාව ධර්ම මාර්ගයට යොමු කිරීමට උපායක් වූවා යැයි හැඟෙනවා.



සම්මුඛ සාකච්ඡාවේදී අනාගත අභිලාෂයන් ගැන පවසන ජේම්ස් කියෝකයිචෝ සාන්

1963 අවුරුද්දේ උපත ලබා, බ්‍රවුන් විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබා නීතිඥයෙකු ලෙස කටයුතු කරනවා. බෲක්ලින් විශ්ව විද්‍යාලයේ උගන්වමින්, ධර්ම ශාඛාවේ ඉංග්‍රීසි භාෂා කණ්ඩායමේ නායක ලෙසත් මහජන සම්බන්ධතා ප්‍රධානී ලෙස කටයුතු කරන අතර, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ රිෂ්ෂෝ කෝසෙයි කායි නියෝජිත සහ WCRP හි අමෙරිකා කණ්ඩායමේ භාණ්ඩාගාරික ලෙස ද කටයුතු කරනවා. මම රිෂ්ෂෝ කෝසෙයි කායි දෙවන පරම්පරාවේ සාමාජිකයෙකු වන අතර, 2023 අවුරුද්දේ දෙසැම්බර් මාසයේ සිට නිව්යෝර්ක් ධර්ම ශාඛාවේ කියෝකයිචෝ ලෙස කටයුතු කරනවා.

2008 අවුරුද්දේ අම්මාව විශේෂ රෝගී සත්කාර ඒකකයකට යොමු කලා. 2009 අවුරුද්දේ ඇය මිය ගියත්, මිය යන මොහොත දක්වාම ලෙඩ ඇඳේ සිටියත්, හදවත් රෝගයකින් සහ විශාදයෙන් පෙළෙන තාත්තා ගැන දුක් වෙමින්, 'තාත්තාට කොහොමද, සනීපෙන් ඉන්නවද ඔයා තාත්තාව හොඳින් බලාගන්න' යැයි නිතරම පැවසුවා. බුදු දහමේ 'උගන්වන මේ මොහොත වැදගත්කොට සලකන්න' යැයි උගන්වයි. අම්මත් අවසාන මොහොත දක්වාම 'මේ මොහොතේ අර්ථවත් ලෙස ජීවත් වෙමු' යන්න ක්‍රියාවෙන්ම මට ඉගැන්වූවා යැයි හැඟෙනවා.

**මේවනතෙක් ධර්ම ශාඛාවේ කල රාජකාරීන් සහ සම්බන්ධ වූ ක්‍රියාකාරකම් මොනවාද?**

මම ධර්ම ශාඛාවේ ඉංග්‍රීසි භාෂා කණ්ඩායමේ ප්‍රධානියා ලෙස කටයුතු කල අතර, සෑම සතියකම ඉරිද දින සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය උගත්වමින් කටයුතු කලා. දේශනයන්ට දින තුන හතරකට පෙර පොත් පත් කියවා දේශනය සකසාගෙන බිරිද ඉදිරිපිට දේශනය ඉදිරිපත් කර පසුව ධර්ම ශාඛාවේ පැවැත්වූවා. මගේ දේශනයන් තුලින්, බුදුන් වහන්සේ, නිමාතෘ තුමා සහ නිචිකෝ නිවානෝ තුමා සමග සාමාජිකයින්ව කෙසේ හෝ සම්බන්ධ කිරීමට, සාමාජිකයින්ගේ ජීවිත වෙනස්කර සතුට ගෙන එන්න හදවතින්ම කටයුතු කලා.

තවද, විදේශ කටයුතු සම්බන්ධීකාරක ලෙස නිව්යෝර්ක් බෞද්ධ සංගමයට සම්බන්ධ වී සමාජසේවා කටයුතු රාශියක් සිදු කරනවා. නිව්යෝර්ක් බෞද්ධ සංගමය නිකාය නොවන බෞද්ධ සංවිධානයක් වන අතර, චීනය, දකුණු කොරියාව, තායිවානය ඇතුලු රටවල් 80 ක පමණ ආසන්නව 900,000 ක සාමාජික පිරිසක් සිටින එක්සත් ජනපදයේ ඇති විශාලම බෞද්ධ සංවිධානයයි. මේ වන තෙක් ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස, හිරොෂිමා නාගසාකි සිදුවීමෙන් මියගිය අය වෙනුවෙ සූත්‍ර සජ්ජායනය මෙන්ම ආසියාතික රටවල අපරාධ සහ කළු ජාතිකයින් වෙන් කොට සැලකීම වැළැක්වීමේ වැඩසටහන් සිදු කරනවා.



මියගිය මව, මේරියන් සමඟ

එවැනි ක්‍රියාකාරකම් සිදු කරන අතර තුර, නිව්යෝර්ක් බෞද්ධ සංගමයේ විධායක අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලැබුණු අතර, 2017 අවුරුද්දේ පූජකවරුන් සහ බෞද්ධ නායකයින් විශාල පිරිසක් අතරින්, මම ගිහි බෞද්ධ සංවිධානයක සාමාජිකයෙකු වුවත් මට පළමු වතාවට මම සංගමයේ සභාපති ධූරයට පත් වුනා. එය මට මහත් පුදුමයක් වුවත්, 'නිව්යෝර්ක් නගරවැසියන් වෙනුවෙන් වෙනදට වඩා කැපවීමෙන් කටයුතු කරන්න' යැයි බුදුන් වහන්සේගෙන් ලද රාජකාරියක් ලෙසත්, නිර්මාතෘ තුමා නිචිකෝ නිවානෝ තුමා සහ කෝසෙයි කායි සාමාජිකයින්ගේ නියෝජිතයෙකු යන හැඟීමෙන් භාරගනු ලැබූවා. ඉන් අවුරුදු 04 කට පසු මේවන විට සභාපතිට සහාය දැක්වීම සඳහා උප සභාපති ලෙස කටයුතු කරනවා.

දිනක් නිව්යෝර්ක් නගරාධිපති එරික් ඇඩම්ස් මහතා 'නිව්යෝක් නගරය සතුටින් ජීවත් වීමට හැකි නගරයක් කිරීමටනම්, බුදුදහමේ ප්‍රඥව අවශයයි. ඒ සඳහා අපට ඔබ වැනි බෞද්ධ පිරිස් අවශයයි' ලෙස හිතාගත නොහැකි කතාවක් පැවසූ විට, නිර්මාතෘ තුමාගේ නිචිකෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් වල විශිෂ්ඨත්වය සහ මම කෝසෙයි කායි සාමාජිකයෙකු වීම ගැන මහත් සතුටක් ආඩම්බරයක් දැණුනා.

**සූත්‍ර පොත තුල ඇති වැදගත් කොට සලකන සූත්‍රය කුමක්ද?**

සමන්තභද්‍ර බෝධිසත්වයන් මෙනෙහි කිරීම පිළිබඳ සූත්‍ර යේ එන 'සියළු කර්ම බාධකයන් පිළිබඳ සාගරය කෙනෙකුගේ සාවද්‍ය චින්තනයන්ගෙන් නිපදවේ. කෙනෙක් ඒ පිළිබඳ පසු තැවීමට සූදනම් විය යුතුය. කෙනෙක් සියළු දේවල පවත්නා යථාතත්වය ඍජුව වාඩි වී මෙනෙහි කල යුතුය.' යන ඡේදය වැදගත් කොට සලකනවා. අවට ලෝකයේ සිදුවන සෑම සිදුවීමක්ම ඒ ආකාරයෙන්ම පිළිගෙන කටයුතු කරන්නේනම්, සූර්යාලෝකයේ තාපයට හිම දියවනවාක් මෙන් සියළු දුක් කරදර නැතිවී යනවා. පසුවිපරම් කිරීමේ වැදගත්ම කාරණය වන්නේ ප්‍රායෝගික පුහුණුවයි. එනිසා බුදුන් වහන්සේගේ ඉගැන්වීම් නියමාකාරයෙන් ප්‍රායෝගිකව පුහුණු කරන්නේනම්, අප තුල දීප්තිමත් සහ ධනාත්මක ජීවිතයක් ගත කිරීමට බලාපොරොත්තුවක් ඇති කරයි.

**නිර්මාතෘ තුමා, නිචිකෝ නිවානෝ තුමා උගන්වා ඇති කරුණු වලින් තදින්ම හදවතේ රැඳී තිබෙන කාරණාව කුමක්ද?**

'සෑම හමුවීමක්ම වැදගත් කොට සැලකීම' සහ 'අන් අය ප්‍රථමයෙන්' යන වදන් මාව දිනපතා දිරිගන්වනවා. අපි

යම් ගමනක් යනවානම් එයට මාලිමක් සහ සිතියමක් අවශය වනවා සේම ජීවන ගමනටත් මාලිමාවක් සහ සිතියමක් අවශය වේ. ගමනාන්තය සහ යායුතු දිශාව පැහැදිලි නොවන්නේනම්, ගමන තුලත් ජීවිතය තුලත් අතරමං වනවා. උදහරණයක් ලෙස, නිර්මාතෘ තුමාගේ වචන ජීවිතයට මාලිමාවක් වැනිය, නිච්කෝ නිවානෝ තුමාගේ වචන ජීවිතයට සිතියමක් වැනිය. අනාගතය අවිනිශ්චිත ලෝකයේ, සුරක්ෂිතව සතුටින් ගතකිරිමට නම්, මාලිමාවත් සිතියමත් යන දෙකම අත්‍යවශය බම මා විශ්වාස කරනවා.

### අනාගත අභිලාෂයන් සහ සිහින මොනවාද?

ධර්ම ශාඛාවේ අතීත සාමාජික සාමාජිකාවන්, අපට බුදුන් වහන්සේගේ ඉගැන්වීම් මේ ආකාරයට ලබාදුන් ජපානයේ ධර්ම මිතුරන්, ඇතුළු සියලුම දෙනාව අගය කොට සලකකම්. නිව්යෝක් නගරාධිපති ඇඩම්ස් මහතා බලාපොරොත්තු වන පරිදි අපි ධර්ම මිතුරන් එක්ව ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් බුදුන් වහන්සේගේ ඉගැන්වීම් තුලින් නිව්යෝර්ක් නගරයේ වෙනසක් ඇති කිරීමට බලාපොරොත්තු වනවා.



*නිව්යෝර්ක් ශාඛාවේ, නව ශාඛා ප්‍රධානී ලෙස පත්වීමේ උත්සවයේදී*
*(ඉදිරි පේළියේ දකුණු පස සිට තුන් වෙනියට)*

# ත්‍රිවිධ රත්නය

බුදුන් වහන්සේ මේ ත්‍රිවිධ රත්නය ඉතාමත් වැදගත්කොට සළකන්න යැයි දේශණා කලා. ත්‍රිවිධ රත්නය යනුවෙන් අදස් කරන්නේ 'බුද්ධ, ධම්ම, සංඝ' වන අතර යහපත් බෞද්ධයෙකු වීමට හදවතේ මූලික පදනම වන්නේද එයවේ.

'බුද්ධ' යනු, බුදුන් වහන්සේ වේ (සදතනික ආදී බුද්ධ ශාක්‍යමුණීන්ද්‍රයන් වහන්සේ)
'ධම්ම' යනු, බුදුන් වහන්සේ දේශණා කල ධර්මයයි.
'සංඝ' යනු, ධර්මය පිළිපදිමින් ධර්මයේ හැසිරෙන පිරිසයි.

මෙම ත්‍රිවිධ රත්නය මුල්කරගෙන ධර්මයේ හැසිරෙනවා නම්, සතුටින් පිරි ජිවිතයක් ගත කිරීමට හැකිවේ.







### දැනුමට යමක්

මේ ත්‍රිවිධ රත්නය මූලික කරගෙන ධර්මයේ හැසිරෙන්නේ නම්, සතුටින් පිරි යහපත්වූ ජීවිතයක් ගත කිරීමට හැකිවේ. 'බුද්ධ, ධම්ම, සංඝ' යන මේ වටිනා මාණික්‍යය 3 මූලික කරගෙන කටයුතු කිරීම 'ත්‍රිවිධ රත්නය කෙරෙහි භක්තියෙන් කටයුතු කිරීම' යනුවෙන් හඳුන්වයි. ත්‍රිවිධ රත්නය උදෙසා ගෞරව භක්තියෙන් කටයුතු කිරීම බෞද්ධයෙකුගේ මූලික පදනම බවට පත්වන අතර, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේද ඉතාමත් වැදගත්කොට සළකන ඉගැන්වීමකි.

※කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

# සාමාජික අධිෂ්ඨානය




'සාමාජික අධිෂ්ඨානය' තුළ, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය පිහිටුවීමේ අභිප්‍රාය සහ අරමුණ, සේම සාමාජිකයෙකු ලෙස ධර්මය පුරුදු පුහුණු කිරීමේ අරමුණ සරලව කෙටින් විග්‍රහ කර තිබේ.

අප සංවිධානයේ ගරු කටයුතු ආදිකර්තෘ
නික්යෝ නිවානෝ තුමාගේ මග පෙන්වීම යටතේ,
රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ සාමාජික අපි,
ආදී බුද්ධ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ සරණ යමු.
සත්‍ය වූ විමුක්තිය බුද්ධ ධර්මයෙහි බවද පිළිගනිමු.
ගිහි බෞද්ධයන්ගේ අධ්‍යාත්මික ශක්තියෙන්
පෞද්ගලික ශික්ෂණය තුළින් සෙසු
අයද මෙහෙයවමින්,
අපගේ ඥානය හා ශ්‍රද්ධාව පිළිබඳ
ප්‍රගුණතාව වර්ධනය කරමින්,
පරිපූර්ණවීමට අධිෂ්ඨාන කරමු.




තවද අපගේ පවුල්වලත්, සංවිධානවලත්,
රටවලත්, ලෝකයේත් සාමය ඇති කිරීම සඳහා,
බෝධිසත්ව චර්යාව අනුගමනය
කිරීමට තරයේ අධිෂ්ඨාන කරමු.

### දැනුමට යමක්

'ධර්මය ඉගෙන ගනිමින්, ප්‍රයෝගික පුහුණුවේ යෙදීම' යන්නෙහි 'ප්‍රයෝගික පුහුණුවේ යෙදීම' යනු, සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් පුරුදු පුහුණු කිරීම වේ. එලෙස ධර්මය පුහුණු කරනවිට කොතනක හෝ තැනකදී දැනුම මදි යැයි දැනුන විට 'ඉගෙන ගැනීමේ' වැදගත්කමද අවබෝධවේ. ඉගෙන ගනිමින් ධර්මය පුහුණුවේ යෙදීම, ධර්මය පුහුණුවේ යෙදෙමින් ඉගෙන ගැනීම. මේ ඉගැන්වීම් දෙක හරියට වාහනයක රෝද දෙක වැනිය.

ෑම

# ධර්මය අන් අයට කියාදීම තුලින් තමන් අවබෝධ කරගැනීම

නික්යෝ නිවානෝ තුමා,
නිර්මාතෘ, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය



සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ධර්මාචාර්යවරයෙක් යන 10 වන පරිච්ඡේදයේ, 'ධර්මාචාර්යවරයෙකුගේ පස් වැදෑරුම් ක්‍රියාකාරකම්' වල හතරවන කරුණ ලෙස 'ධර්මය පැහැදිලි කිරීම' යනුවෙන් සඳහන්ව තිබේ. එනම් ධර්මය 'පිළිගෙන, කියවමින්, සජ්ජායනය' යන අකර්මණ්‍ය ආකාල්පවල සිට තව පියවරක් ඉදිරියට තැබූ ධණාත්මක ක්‍රියාවක් වන අතරම ධර්මාචාර්යවරයෙකුගේ පස් වැදෑරුම් ක්‍රියාකරකම් වල වැදගත්ම කාරුණ වන්නේද 'ධර්මය පැහැදිළි කිරීම' යැයි මම සිතනවා.

එයට හේතු දෙකක් තිබේ.

පළමු කරුණ නම්, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සෑම සියළුදෙනාවම බුද්ධත්වය කරා ගෙන යන පරමාදර්ශී ඉගැන්වීමක් වන අතර, තමා පමනක් ධර්මය පිළිගෙන, සජ්ජායනය කර 'දුකින් මිදී' එතනින් නොනැවතී අන් අයගේ හිතසුව පිණිස ධර්මය දේශණා කල බුදුන් වහන්සේගේ මහා කරුණාවන්ත හදවත ගැන කල්පනා කල විට, එම හදවතට ලගා වීමට අපට තව දීර්ඝ ගමනක් යායුතුව ඇති බවයි.

'බුද්ධත්වය ශාක්ෂාත් කර ගැනීම' යැයි පැවසූ විට, 'කිසිදිනක ළඟාවිය නොහැකි දෙයක්' යැයි සිතා බලාපොරොත්තු සුන් කරගන්නා නමුත්, එසේ කලයුතු නොවේ. බුදුන් වහන්සේ යනු, යථාර්තය අවබෝධ කරගත් පුද්ගලයා වෙයි. මේ මුළු විශ්වය ගැන සහ ජීවිතය ගැන යථාර්තය අවබෝධ කරගත් පුද්ගලයා බුදුන් නම් වේ.


එසේ නම් මේසාවිශාල පිරිසකට බුද්ධත්වය ළඟා කරදීමට අවශ්‍ය වන්නේ ඇයි? එනම් ලෝකයේ වර්තමාන තත්වය ගැන සිතා බලා නුදුරු අනාගතයේදී මනුෂ්‍යයන් හැසිරෙන ආකාරය ගැන පැවසීමට යැයිද කිව හැකිය.

වර්ථමානයේ මිනිසුන් දැඩි 'තණ්හාවෙන්' වෙලී  ජීවතය ගතකරමින් සිටී. එම නිසා පාරිසරක විනාශයන්, ස්වභාවික සම්පත් ක්ෂය වීම සහ මිනිසා විසින් සිදුකරන අහිතකර ක්‍රියා තුලින් කාලගුණික විපර්‍යාස ඇතිවී එය මහා සාගත වලටද තුඩු දෙන අතර, මේ ආකරයට දේවල් සිදුවුවහොත් තව වසර 100 ක් පමන ගතවන විට මනුෂ්‍ය වර්ගයාගෙන්ද වැඩි කොටසක් වඳවී යනු ඇති බව සමහර විද්‍යාඥයන් මත පලකරයි. වර්ථමාන ලෝකය යනු, හරියට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ 'උපමාව' යන තුන් වන පරිච්චේදයේ සඳහන්වන 'ගිණිගත් නිවස' මිස අන් කිසිවක් නොවේ. විශාල මාළිගාව ගිණිගන්නා අතර එයින් පිටවීමට ඇත්තේ එක් පටු දොරක් පමණි.

'උපමාව' යන තුන් වන පරිච්චේදය තුල, විශාල මාළිගාවට ඇත්තේ එක් පටු දොරටුවක් පමණක් බව සඳහන්වේ. එම දොරටුවෙන් අදහස් කරන්නේ 'තණ්හාව' පාලනය කරගතයුතු බවයි. එනම් 'තණ්හාව පසෙකලා ලද දෙයින් සතුටුවෙමින් ජීවත් වීම වේ'. මෙය පැවසීමට පහසු කාරණයක් වුවද, ප්‍රායෝගිකව පුරුදු පුහුණු කිරීමට අපහසු කාරණයකි. මේ කාරණය ඔබ හැමදෙනාටම හැගෙන දෙයක් බව මට විශ්වාසයි.

එසේනම් කුමක් කළොත් හොඳද? 'උපමාව' යන තුන් වන පරිච්චේදයේ 'ගිණිගත් නිවස' යන උපමා කතාවේ ගිණිගත් නිවසේ පටු දොරටුවට එපිටින් බුදුන් වහන්සේ ලක ලැස්තිකර තිබූ 'බැටළු කරත්තය (ශ්‍රාවක), මුව කරත්තය (ප්‍රත්‍යයේක බුද්ධ), ගව කරත්තය (බෝධිසත්ව) ලබා ගැනීම උදෙසා කටයුතු කරන්න යැයි උගන්වනු ලබයි.

කෙසේ වෙතත් 'යථාර්තය අවබෝධ පුද්ගලයෙකු' බවට පත්වීමේ මාර්ගය හැර දුකින් මිදීමට අපිට වෙනත් මාර්ගයක් නොමැත. වෙනත් ආකාරයකට පවසනවා නම්, සියළුමදෙනා තුල තිබෙන 'බුද්ධ ශක්තිය අවධි කරලිම' යන්නයි. අපි එසේ කටයුතු කරන්නේ නම්, 'තණ්හාව' නිරායාසයෙන්ම, ස්භාවිකවම නැතිවී යනු ඇත. පිටවීමට ඇති එකම පටු දොරටුව යනු, අපි තුල තිබෙන 'බුද්ධ ශක්තිය අවධිකරලීම' මිස වෙන කිසිවක් නොවේ.



# Director’s Column

## වසර ආරම්භයේදීම සිත පිරිසිදු කරගනිමු
## (සචිත්ත පරියෝ දපනං)

කෙයිචි අකගාවා මහතා
අධ්‍යක්ෂක, රි.කෝ.කා. අන්තර්ජාතික මුලස්ථානය

සුභ නව වසරක් වේවා.
මෙම ‘අධ්‍යක්ෂක තීරු ලිපිය ආරම්භ කළ සිව් වෙනි වසර උදාවිය. මෙම වසරේදීත්, තීරු ලිපිය මුල් කරගෙන ධර්මය ඉගෙන ගනිමින්, කියවන ඔබ සමඟ සංවාදයේ යෙදීම නොකඩවා කිරීමට බලාපොරොත්තු වනවා.’

අප සංවිධානයේ 60 වන සංවත්සර පාදක කරගෙන, සංවිධානයේ අරමුණ ‘හදවත හා මනස සංවර්ධනය’ ලෙස නිර්මාණය කර ශත වර්ෂ 4 ක් ගෙවී ගියා. එම වැකිය බුදුන් වහන්සේ විසින් කසීභාරද්වාජ බ්‍රහ්මණයන්ට, ‘ඔබ කුඹුර සී සෑම කරයි, මම මිනිසුන්ගේ හදවත හා මනස සී සෑම කරමින් සංවර්ධනය කරමි’ යන වැකිය මුල් කරගෙන නිර්මාණය නිර්මාණය විය. නිච්කෝ නිවානෝ තුමා ගිය වසරේ නොකඩවා ධර්ම පණිවුඩය තුල නිරෝගීව ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීමට අවධානය යොමු කර ඇති නමුත්, එය යථාර්තයක් බවට පත්කර ගැනීමට හැකිවන්නේ, හදවත හා  මනස සංවර්ධනය කර ගැනීම තුලින් බව විශ්වාස කරමි.

ඒ සදහා, බෞද්ධයන් වන අපි මුලිකවම සියලු බුදුවරුන්ගේ අනුශාසනාව වන සිත පිරිසිදු කරගැනීමට (සචිත්ත පරියෝ දපනං) අවධානය යොමු කළ යුතුය. 2024 වර්ෂයේදී හදවත සංවර්ධනය කර ගනිමින්, බුදුන් වහන්සේගේ ප්‍රාර්ථනයට අනුව ජීවිතය ගත කරනවාද, ආත්මාර්ථකාමි හදවතින් යුතුව කටයුතු කරනවද යන්න, තමාටම කතාකරමින්, සෑම මොහොතකම වෙනස්වන තම හදවතට ආමන්ත්‍රණය කරමින් පසුවිපරම් කළ යුතුයි සිතමි. බෞද්ධයෙකු ලෙස තිබිය යුතු මුලිකම දේවල් තම ශරීරයට බද්ධ කරගනිමින්, සැහැල්ලුවෙන් එදිනෙද ජීවිතය ගත කළ හැකි ආකාරයට ඔබ සියළුදෙනා සමඟින් ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීමට සිතමි. මේ වසරේදීත් ඒ වෙනුවෙන් ඔබ සියළුදෙනා සමඟ සහයෝගයෙන් ලබාදෙන්න.



ඇමෙරිකාවේ ශාන්ත ෆ්‍රැන්සිස් ධර්ම ශාඛාවේ,
නව ශාඛා ප්‍රධානී පිළිගැනීමේ උත්සවයට සහභාගී වු අධ්‍යක්ෂක තුමා (2023/12/17)


# Rissho Kosei-kai International

## Make Every Encounter Matter






## A Global Buddhist Movement




**Information about local Dharma centers**

**facebook**

**twitter**

We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp